මගේ අංකය :- JSC/SPO/EB/2022(2025)

සියලුම,
මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්/මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්/ අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත.

## උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවාවේ අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022

අංක 2088/26 හා 2018 සැප්තැම්බර් මස 11 දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 9.8, 15.2.1 වගන්ති සහ “ඉ” පරිශිෂ්ඨයෙහි දැක්වෙන කොන්දේසි හා විෂය නිර්දේශය අනුව අධිකරණ පවුල් උපදේශක සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය කොළඹ දී පැවැත්වීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- ❖ උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියට 2022.12.31 දිනට පෙර පත්වීම් ලද නිලධාරීන් පමණක් මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුස්සෝ වෙති.

- ❖ අධිකරණ පවුල් උපදේශක II ශ්‍රේණියේ නිලධාරීන් සේවයට බැඳී වසර 06 ක් ගත වීමට පෙර කාර්යක්ෂමතා කඩඉම විභාගය සමත් විය යුතුය.

02. විභාගය පිළිබඳ විස්තරය

| | විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත්වීම සඳහා ලබා ගත යුතු අවම ලකුණු | සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම |
|---|---|---|---|---|---|
| 01 | මනෝ විද්‍යා උපදේශනය පිළිබඳ මූලික අවබෝධය | පැය 02 | 100 | 40 | - |
| 02 | අපරාධ හා සිවිල් නඩු කාර්ය පටිපාටිය | පැය 02 | 100 | 40 | ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වීම හෝ නීතිවේදී උපාධිය හෝ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම. |
| 03 | ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | පැය 02 | 100 | 40 | අ.පො.ස. (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. |

03. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

(i) මනෝ විද්‍යා උපදේශනය පිළිබඳ මූලික අවබෝධය -
උපදේශන මනෝ විද්‍යාව හා පවුල් උපදේශනය පිළිබඳ මූලික අවබෝධය අපේක්ෂා කෙරේ.

(ii) අපරාධ හා සිවිල් නඩු කාර්ය පටිපාටිය -
මෙම ප්‍රශ්න පත්‍රය විවාහ නීතිය, දික්කසාද නඩු සම්බන්ධව හා දරුවන්ගේ භාරකාරත්වය, භාරය සහ ආරක්ෂාව පිළිබඳ නීතිය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ නඩත්තු පනත සම්බන්ධව අපේක්ෂකයා සතු අවබෝධය මැන බලනු ඇත.

(iii) ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය -
අ.පො.ස. (සා/පෙළ) ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රයට සමාන අයුරින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ඇත.

(සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන්ම අපැහැදිලි අත් අකුරු සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ.)

04. මෙම ප්‍රශ්න පත්‍ර බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න ,රචනා ප්‍රශ්න හා/හෝ ප්‍රායෝගික ප්‍රශ්න වලින් සමන්විත වනු ඇත.

05. අධිකරණ පවුල් උපදේශක සේවයට ඇතුළත් විම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් නිලධාරීන් විසින් ' ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය' හැර අනෙකුත් විෂයයන්හි ලිඛිත ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සැපයිය යුතුය.

06. නිලධාරියෙකුට විභාගයට නියමිත සියලු විෂයයන් සඳහා එකවර හෝ එක් එක් විෂයයන් සඳහා වෙන වෙනම හෝ අවස්ථා කිහිපයක දී පෙනී සිටිය හැකිය. එතකුදු වුවත් සාමාර්ථයක් සඳහා එක් එක් විෂය සඳහා අවම වශයෙන් සියයට හතලිහක් (40%) නිලධරයා විසින් ලබා ත යුතුවේ.

07. මෙම විභාගයට ප්‍රථම වරට ඉල්ලුම්කරන අයදුම්කරුවන් විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එකවරකදී සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500 ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු 250 ක් ද විභාග ගාස්තු වශයෙන් ගෙවිය යුතුය. මීට ප්‍රථම මෙම විභාගය සඳහා ඉල්ලුම්කර ඉදිරිපත් නොවූ නිලධරයන් දෙවන වතාවට ඉදිරිපත් වන සේ සලකා විභාග ගාස්තු ගෙවා විභාගයට අයදුම්කල යුතුය. කවර කරුණක් යටතේ වුවද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. මෙම විභාග ගාස්තු **අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්** නමින් මහජන බැංකුව, වේල්ල වීදිය ශාඛාවෙ පවත්වාගෙන යන ගිණුම් අංක **297100199025039** ට බැර කර ලබා ගන්නා ලද පත අයදුම්පත්‍රයෙන් වෙන් කර ගැනීමට හැකි වන පරිදි අමුණා එවිය යුතුවේ.

09. මේ සමඟ ඇති ආකෘති පත්‍රයට අනුව 11 ½ " X 8 ½ " ප්‍රමාණයේ ඝන කඩදාසියේ සකස් කොට සම්පූර්ණ කරන ලද අදාල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර ඔබේ නිර්දේශය සමග **2025 මැයි 30** වන දින හෝ එදිනට පෙර ලියාපදිංචි තැපැලෙන් මෙම කාර්යාලයට එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා අධිකරණ පවුල් උපදේශක සේවයේ II වන ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2022" යනුවෙන් සඳහන් කළ යුතුය.

10. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා නිසි අයුරින් සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. මෙම ලිපිය ඔබ අධිකරණයේ අදාල සියලුම නිලධාරීන්ට දැන්වීමට කටයුතු කරන්න.

සී.එච්.ජී.ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

සී.එච්.ජී. ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12.

අත්/කලේ: එච්.එස්.සෝමරත්න
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2025 මැයි මස 08 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

SPECIMEN APPLICATION FORM
Efficiency Bar Examination for Officers in
Grade II of the Court Family Counsellors' Service– 2022

01. Name:
  1:1 Name with initials Mr./Mrs./Miss: ..........................................................................
  (In block letters)
  1:2 Full name: ...................................................................................................
  (In block letters)
  1:3 Full name: ...................................................................................................
  (In Sinhala/Tamil)

02. National Identity Card Number: ..............................................................................

03. Address:
  3:1 Permanent address: .......................................................................................
  (In block letters)
  3:2 Official address .............................................................................................
  (In block letters)

04. Contact Details
  4:1 Mobile No : ......................................

05. Date of Birth : Date ☐☐ Month ☐☐ Year ☐☐☐☐

06. Personal File No : EA/PF/2 /.........

07. Date of appointment to Grade II of the Court Family Counsellors' Service: ........................

08. The medium in which you sit for the examination:

☐

(Denote with "S" for Sinhala, "T" for Tamil)
Note : Candidates should select the relevant question paper according to his/her appointment.

09. Please give details of subjects and years you sat for the exam previously:

| Year | Subject |
|---|---|
| | I.<br>II.<br>III. |
| | I.<br>II.<br>III |

10. Subject / Subjects you are now offering to sit for:

(i) ..............................................
(ii) ..............................................
(iii) ..............................................

11. (i) The value of payment made as Examination fee: ..............................

(ii) Name of the Bank and the Branch to which the payment was made: ................

(iii) Number and date of the receipt: .......................

| Affix the receipt here |
|---|

I state that the particulars given are accurate and I am entitled to sit for the Examination in the medium mentioned in the paragraph 8 above. I certify that I am appearing for the Examination for the first time / I have annexed the receipt obtained after making the appropriate payment. I agree to be bound by the rules and regulations of the Secretary to judicial service commission regarding conducting of the examination.

.............................. ........................................

Date Signature of the Applicant

Note: Applicant should sign before the Head of the Department/ Registrar of the relevant court.

---

**Attestation**

I hereby certify that Mr./Mrs./Miss........................................................................................................ who is a grade II Court Family Counsellor is personally known to me and signed before me on ..............................

........................................

Signature of the Registrar

Date: ......................................
Name: ....................................
Designation: ............................
Address: ...................................

---

**Certificate of the Head of the Department**

I certify that,

01. The particulars furnished above were checked and found to be accurate.

02. The officer sits for this Examination for the first time/ has made the correct payment as Examination Fee.

03. The applicant is eligible to sit for this Examination.

Designation: ..........................

Date: ......................................

........................................

Signature of the Head of the Department